


**ලංකාවේ මාමා කෙනෙකුගෙන් ළමයාට ලැබුණ ලිපියක්**

පුතා.. එයාලා ඉන්න රට ගැන අපට නිතර අහන්නට ලැබෙනවා.. පත්තර වලින්, රේඩියෝ වලින් එහෙම.. ඊටත් වඩා නිවාඩුවට මෙහෙ එන මාමාලාගෙන්... හරිම සාමකාමී සාදාරණ රටක්ලු නේද..? මම අහන්ට ආසම දේ තමයි ඔයාලගෙ රටේ මැතිවරණ විස්තර. මෙහෙ වාගෙ පෝස්ටර් , රැස්වීම්, පෙලපාලි, බැනර්, හොර චන්ද, මිනී මරා ගැනීම් වාගෙ කිසිම දෙයක් නැතිලු නේද? කොච්චර හොඳයි ද? මිනිස්සු ඡන්දයක් තියෙනවද කියලා දන්නෙත් නැති ගානටලු නේද? ඡන්ද ප්‍රතිඵල පිටවෙච්ච ගමන් ඡන්දේ අමතක කරනවලු නේද? පුතාට පුලුවන් නම් ඒ විස්තර නිතර පත්තර වලට ලියන්න. එතකොට මෙහෙ අයත් හැදේවි... ඒත් පුතා එකක් කියන්ට ඕනා.. දැන් මෙහේ අයත් එක විදිහක්. ඉස්සර වගෙ නෙවෙයි.. ඡන්දේ දා එනකම් කාටද ඡන්දෙ දෙන්නෙ කියලා කියන්නෑ.. ඉස්සර වාගෙ බදාගෙන ඉන්නෙ නෑ. කල්පනා කරලා ඡන්දේ දෙනවා. පුතාලා පුලුවන් තරම් මිනිස්සුන්ට හොඳ දේට උනන්දු කරන්න.. එතකොට මෙහෙ අයත් ඉක්මනට හැදේවි.

**ළමයාගෙන් මාමාට පිලිතුරක්**

මාමේ.. මාමගෙ ලියුම ලැබුණා.. ඒක දැක්කම මට හිනා නොවී ඉන්න බැරි වුණා.. මෙහෙ ඉන්න ලංකාවෙ අය නිවාඩු ආවම මෙහෙ මැතිවරණ ක්‍රමය අගේ කරනවලු නේද? අන්න ඒ කතාව අහනකොට තමයි හිනා එන්නෙ.. මෙහෙ හිටියට එයාලා ට තාම හැදෙන්ඩ බැරි වෙලා.. තාම ඉන්නෙ ලංකාවෙන් එනකොට ආව පක්ෂේ එල්ලිලා. මෙයාලා ලංකාවේ වෙන්නෙ මොනවද කියලාවත් දන්නෙ නෑ.. ඒ වුනාට හැමදාම තමන්ගෙ පක්ෂය බලයට පත්වෙන්න ඕනැ කියලා හිතනවා. හොර ඡන්ද දාලා හරි මිනී මරලා හරි තමන්ගෙ පක්ෂය දිනනවා නම් මෙයාලා සන්තෝසයි. තමන්ගෙ පක්ෂය කරන ඕනෑම දෙයක් හරි.. අනිත් පක්ෂය කරන ඕනෑම දෙයක් වැරදියි කියලා තමයි මෙයාලා හිතන්නෙ.

මාමේ.. ගං වතුර නාය යාම් සුනාමි, කොටි බෝම්බ වාගෙ මහ විලත් වෙනවා නම් මෙහෙ පිරිසකට හරිම සන්තෝසයි.. ඒ තමයි ඒ කාලෙ තියෙන ආන්ඩුවට විරුද්ධ අය. සුනාමිය වෙලාවෙදි මුලු ලෝකයම ඇඬුවා.. ඒත් මෙහෙ අපේ සමහර අයට සතුට සුනාමියට වඩා ඉහළ ගියා.
මුන්ට නම් නියම පරිප්පු.. මුන්ට කවදාවත් මේ රට හදන්න බැහැ.. දැං මුන්ට හොඳ වැඩේ.. හහ්.. හහ්.. හා.. එයාලා මිනාවුනේ එහෙමයි. එහෙම අය මෙහෙ මැතිවරණ අගේ කරන එක විහිලුවක් නේද මාමේ..?

ඉතින් මාමෙ දැන් ඔහේ අය ටික ටික හැදිලා කියලා අහන්ට ලැබෙන එක සන්තෝසයි.. මාමට පුලුවන් නම් ඒ විස්තර මෙහේ පත්තර වල දාන්ට.. කවදා හරි දවසක ලංකාවෙන් පක්ෂ දේශපාලනය අයින් වුනත් මෙහෙ අය පක්ෂ වලට බෙදිලා යකා නටාවි. මාමට මධ්‍යස්ථ භාවයේ පිහිටයි.
මීට
**ළමයා**

## සිරි පා වදිමු.......



හිරු දෙව් තෙද නසා කිම්දී නිල් සයුරෙ
බුදු සිරිපා වදී සමනළ ගිරි සිරසේ
නිරිඳුන් පමණ නොව ඉපැරණී රජ දවසේ
සුර අඟනන් ද මේ පින කළ බව පැවසේ

මිටියාවතේ සමනළ කඳු සෙවණැල්ලේ
ගී පද ඇසේ විහඟුන්ගේ අරුණැල්ලේ
එහඬ සොයා කඟ සමනළ් කැල ඉගිලේ
සිරිපා පුදා දෙව්ලොව යයි සැනසිල්ලේ

සීත ගඟුලෙ නා සුදු පිරුවට අඳිමින්
සාදුකාර දී තුන් සරණය ගයමින්
සුමන සමන් දෙවිඳුන්ගේ රැකවරණින්
සිරිපා වඳිති දන මහගිරිදඹ නගිමින්

ආදම් ඇඩම් සිව දෙවිඳුගෙ නමින් වුව
නෑකම් දරාගෙන පිවිතුරු මිනිස් බව
මේ කඳු මුදුනෙ යළි හමුවෙමු සිතින් නව
නෑ වෙන තැනක් මේ වැනි සිව් කොනේ ලොව

**පද්මසිරි හේරත්**
වෙරිබි වික්ටෝරියා


# WANT TO GET PR...?

**ඕස්ට්‍රේලියාවේ දී**
**ONSHORE**
**STUDENT - PR**
**Have you completed or about to complete your Degree/Diploma?**
**Are you worried about:**
- How to obtain positive skill assessment.
- Not enough points to apply for PR?
- 60 points for occupation?

**ශ්‍රී ලංකාවේ දී**
**OFFSHORE**
**SKILLED MIGRATION**
- A Trade Certificate/ Diploma/ Degree or Professional Qualification?
- Have 1/3/4/6/7 year(s) experience in a skilled occupation or business?

**OTHER MIGRATION**
*Business Owners & Investors/ Visitors/ Spouse/ Parents/ Remaining Relative/ Distinguished Talent*

**IF YOU HAVE BLOOD RELATIVES IN AUSTRALIA IT IS AN ADVANTAGE**
YOU SHOULD BE BELOW 45 YEARS
Good Knowledge of English
Student Migration FREE SERVICE

**TIME TO GET PROFESSIONAL ADVICE**
Hirosh H. Gamage ASA, AAIBF (Snr), MMIA
(Registered Migration Agent No: 0320696)

Sannasa

**Multinational Migration Services**
20/215, Betula Avenue, Mill Park
Vic 3082, Australia
Tel: 03 97377384
Fax: 03 94364328

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

**AUSTRALIAN MIGRATION SERVICES**
388, (1st Floor), Galle Road, Colombo 03
Tel: 011 2372759 Fax: 011 2372759
E-mail: info@multinational.com.au

For More details or FREE Online Assessment Visit Our Web Site
www.multinational.com.au